# ආගමන සමයේ දෙවන සතිය
# බ්‍රහස්පතින්දා

**පළමුවන කියැවීම** යෙසායා 40: 13–20

යෙසායා දිවැසිවරායාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

*ඔබ ගලවා ගන්නා ඉශ්රායෙල්හි සුවිශුද්ධ දෙවිඳාණෝ මම වන්නෙමි*

මම නුඹේ දෙවිඳාණෝ ය. "බිය නොවන්න. නුඹට පිහිට වන්නෙමි" යි කියමින් මම නුඹ ශක්තිමත් කරන්නෙමි. සමිඳාණෝ නුඹේ දකුණත අල්ලා ගනිමින් මෙසේ වදාරණ සේක. "ඉශ්රායෙල්වරුනි, පණුවකු වැනි නුඹලා කුඩා ව, දුර්වල ව සිටියත් බිය නොවන්න. මම නුඹලාට පිහිට වන්නෙමි. නුඹලා ගලවා ගන්නා ඉශ්රායෙල්වරුන්ගේ සුවිශුද්ධ දෙවිඳාණෝ මම ය. මම නුඹලා මුවහත්, අළුත් දැති ඇති යන්ත්‍රයක් මෙන් කරන්නෙමි. නුඹලා කඳු මැඩ, පොඩිකර හෙල් බොල් වී මෙන් කරන්නහු ය. නුඹලා ඒවා පොළන්නහු ය. එවිට ඒවා, සුළඟට ගසා ගෙන යන්නේ ය. සුළි සුළඟින් විසිරී යන්නේ ය. එහෙත්, මම නුඹලාගේ දෙවිඳාණන් වන බැවින් නුඹලා ප්‍රීති වන්නහු ය. ඉශ්රායෙල්වරුන්ගේ සුවිශුද්ධ දෙවිඳාණන් වන මට නුඹලා ප්‍රශංසා කරන්නහු ය. "අසරණ දිළිඳු අය වතුර සොයා එය නො ලැබ, උගුර කට වේළී පිපාසයෙන් සිටින විට සමිඳාණන් වන මම ඔවුන්ගේ යැඳුම්වලට පිළිතුරු දෙන්නෙමි. ඉශ්රායෙල්හි දෙවිඳාණන් වන මම ඔවුන් අත්නොරින්නෙමි. මම මුඩු කඳු මුදුන්වල ගංගා ගලා යන්න ද මිටියාවත් මැද උල්පත් ඇති වන්න ද සලස්වන්නෙමි. කාන්තාරය මැද දිය පොකුණක් ද වියළි දේශයෙන් උල්පත් ද ඇති කරන්නෙමි. මම කාන්තාරයෙහි කිහිරි, පිටිම්, මරද හා ඔලීව හටගන්වන්නෙමි. වනයෙහි දේවදාර, හල් හා සයිප්‍රස් එකට හටගන්වන්නෙමි. සෙනග මෙය දැක, සමිඳුන් වන මා එය කළ බව දැනගන්නෝ ය. ඉශ්රායෙල් හි සුවිශුද්ධ දෙවිඳු මේ දේ සිදු කළ බව ඔව්හු තේරුම් ගන්නෝ ය.

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 145: 1, 9–13 |
|---|---|

පිළිතුර: සමිඳාණෝ දයාවෙන් ද අනුකම්පාවෙන් ද පූර්ණ වන සේක.

ගීය: මා දෙවි රජිඳුනි, ඔබ ගුණ මම ගයමි. ඔබ නම සදාකල් ම පසසමි.
සමිඳාණෝ සියල්ලන්ට කරුණාව පාන සේක.
එතුමන්ගේ සුමුදු දයාව මවන ලද සියල්ලන් වෙත පැතිරෙයි.

සමිඳුනි, ඔබ මැවූ සියලු දේ ඔබට තුති පුදයි.
ඔබේ සැදැහැවත්තු ද ඔබට ප්‍රශංසා කරති.
ඔව්හු ඔබේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති.
ඔබේ බලමහිමය ගැන ද කතා කරති.

එසේ කරන්නේ දෙවිඳුන්ගේ ප්‍රබල ක්‍රියාත්
රාජ්‍යයේ තේජෝ මහිමයත් මිනිසුන් හට දන්වන පිණිස ය.
ඔබේ රාජ්‍යය සදාකාලික ය.
ඔබේ ආධිපත්‍යය ද සියලු පරම්පරාවල ම පවත්නේ ය.

## සුබසුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
සමිඳුනි, අපි සිතින් අවංකව ඔබ ඉදිරියෙහි ප්‍රීති ප්‍රමෝද වන පිණිස
ඔබගේ සාමය රැගෙන අප වෙත වැඩිය මැනව.
ආලේලූයා!

| සුවිශේෂය | මතෙව් 11: 11–15 |
|---|---|

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය මෙසේ ය.

*මිනිස් සංහතිය තුළ ජුවාම්ට වඩා උතුම් කෙනෙක් පහළ නොවී ය.*

“සැබැවින්ම මම ඔබට කියමි, මුළු මිනිස් සංහතිය තුළ ජුවාම්ට වඩා උතුම් කෙනෙක් පහළ නොවී ය. එහෙත් ස්වර්ග රාජ්‍යයෙහි ඉතා සුළු තැනැත්තේ වුව ද, ඔහුට වඩා උතුම් ය. ස්නාවක ජුවාම්ගේ කාලයේ පටන් මේ දක්වා ස්වර්ග රාජ්‍යය බලාත්කාරකමට යට වී ඇත. බලාත්කාරකම් කරන්නෝ එය බලයෙන් අත්පත් කරගනිති. මන්ද, දිවැසිවරු හා ව්‍යවස්ථාවලිය ජුවාම් දක්වා දිවැස් වැකි කී හ. ඔබ පිළිගන්න කැමැති නම්, එන්නට සිටින එලියා මොහු ය. සවන් ඇත්තෝ සවන් දෙත්වා!” යි ජේසුස් වහන්සේ වදාළ සේක

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචය මෙසේ ය.*